# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1928/28 - 2015 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2015.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1225/32 දරන, 2002 මාර්තු මස 01 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පල කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින්වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී.එම්.එල්.සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 අගෝස්තු මස 21 දින.

01. **ක්‍රියාත්මක වන දිනය** :

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2015.04.17 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. **පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. **සේවයට අයත් වන සේවා ගණය පිළිබඳ විස්තර** :

3.1 සේවා ගණය - විධායක, ජ්‍යෙෂ්ඨ විධායක

3.2 ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
විශේෂ ශ්‍රේණිය

04. **සේවාවේ කාර්ය භාරය** :

ශ්‍රී ලංකාවේ සමස්ත මානව සම්පත් සංවර්ධනය උදෙසා සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීම හා ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, නියාමනය හා ඇගයීම සහ ද්විතීය අධ්‍යාපනය සහ පශ්චාත් ද්විතීය අධ්‍යාපනය අතර සම්බන්ධතාවය ගොඩනැංවීම හා ඉගෙනුම හා ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දායක වීම තුළින් අධ්‍යාපන පද්ධතියේ සියලු ආයතන කළමනාකරණය හා අධීක්ෂණය තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සහතික කිරීම.


1A - PG 2585 — 206 (2015/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. වැටුප් ක්‍රමය :

5.1 වැටුප් කේත අංකය :

ජ්‍යෙෂ්ඨ විධායක - SL – 3- 2006
විධායක - SL - 1- 2006

5.2 වැටුප් පරිමාණය :

ජ්‍යෙෂ්ඨ විධායක - රු. 42,390 - 12 × 1,310 - 58,110
විධායක - රු. 22,935 - 10 × 645 - 8 × 790 - 17 × 1,050 - 53,555

5.3 අදාළ ශ්‍රේණි ක්‍රමය හා එක් එක් ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| 111 | පියවර 01 (SL – 1 – 2006) | රු. 22,935 |
| 11 | පියවර 12 (SL – 1 – 2006) | රු. 30,175 |
| 1 | පියවර 20 (SL – 1 – 2006) | රු. 36,755 |
| විශේෂ | පියවර 01 (SL – 3 – 2006) | රු. 42,390 |

06. සේවයට අයත් තනතුරු :

6.1 සේවයට අයත් තනතුරු :

| | ශ්‍රේණිය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සාමාන්‍ය සේවක සංඛ්‍යාව | විශේෂ | 04 |
| | I ශ්‍රේණිය | 238 |
| | II ශ්‍රේණිය | 429 |
| | II/III ශ්‍රේණි | 753 |
| විශේෂ සේවක සංඛ්‍යාව | II/III ශ්‍රේණි | 1267 |
| | **එකතුව** | **2691** |

සටහන : සේවයට අයත් තනතුර ශ්‍රේණි අනුව වර්ගීකරණය " අ " උපලේඛණයේ ඇත.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :
සාමාන්‍ය සේවක සංඛ්‍යාව

I ශ්‍රේණිය 238
II ශ්‍රේණිය 429
II/III ශ්‍රේණි 753

විශේෂ සේවක සංඛ්‍යාව
II/III ශ්‍රේණි 1267

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා 111, 11 හා 1 ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.
සටහන:

(i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II හා III වැනි ශ්‍රේණියේ විශේෂ සේවක සංඛ්‍යාවට අයත් නිලධාරියෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරක් දැරිය නොහැක්කේය.

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II හා III වැනි ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් නිලධාරියෙකුට විශේෂ සේවක සංඛ්‍යාවට අයත් තනතුර දැරිය නොහැක්කේය.

6.3 තනතුරු වල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

07. **බඳවා ගැනීමේ ක්‍රමය :**

7.1 **බඳවා ගන්නා අනුපාතය :**

| *ධාරාව* | *සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය* | *විශේෂ සේවක සංඛ්‍යාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය* |
|---|---|---|
| විවෘත | 50% | - |
| සීමිත | 20% | 100% |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය | 30% | - |

* විශේෂ සේවක සංඛ්‍යාවේ හා සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු වෙන වෙනම ගණනය කර ඉහත අනුපාත මත බඳවා ගනු ලැබේ.

* විවෘත හා සේවා පළපුරුද්ද හා කුසලතා ධාරාවන් යටතේ බඳවාගනු ලබන්නේ සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ අනුමත තනතුරුවල ඇති වන පුරප්පාඩු සඳහා පමණි.

* ව්‍යතිරේකය : විශේෂ සේවක සංඛ්‍යාව යටතේ බඳවා ගනු ලබන තොරතුරු තාක්ෂණය විෂයය හා ඉංජිනේරු හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයන් සඳහා එම විෂයයන්හි පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% නොඉක්මවන පරිදි විවෘත තරග විභාගය මගින් මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක දින සිට වසර 05 දක්වා අවශ්‍යතාවය පරිදි බඳවා ගත හැකිය.

7.2 **විවෘත බඳවා ගැනීම :**

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණිය

7.2.2 **සුදුසුකම් :**

7.2.1.1 **අධ්‍යාපන සුදුසුකම් :**

අ. සාමාන්‍ය සේවක ගණය සඳහා බඳවා ගැනීම
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

ආ. විශේෂ සේවක ගණය සඳහා බඳවා ගැනීම. (තොරතුරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණ විෂයය)
තොරතුරු තාක්ෂණ විෂයය සඳහා සහ තාක්ෂණවේදය විෂයය යටතේ ජෛව පද්ධති තාක්ෂණ විෂයය සඳහා නියමිත විෂයයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

ඇ. විශේෂ සේවක ගණය සඳහා බඳවා ගැනීම. (ඉංජිනේරු තාක්ෂණ විෂයය)
යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම.

7.2.2.2 ***කායික සුදුසුකම් :***
සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.2.2.3 ***වෙනත්:***

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය ;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය ;
(iii) විභාගයට පෙනී සිටිය හැකි උපරිම වාර ගණන 02 කි ;
(iv) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.2.3 ***වයස් සීමාව :*** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

7.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය :*

7.2.4.1 **ලිඛිත විභාගය :**

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ.

ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය ''1'' පරිශිෂ්ඨයේ දැක්වේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (I) අවබෝධය | 100 | 40% |
| (II) බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| (III) සාමාන්‍ය දැනීම | 100 | 40% |
| (IV) රචනය හා සාරාංශය | 100 | 40% |

7.2.4.1.1 **පවත්වන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 **වාචික පරීක්ෂණය :** (ලකුණු 25 යි)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :

තනතුරට අදාළව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය, තර්කනය හා ගැටලු විසඳීම හා සන්නිවේදන හැකියාව පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ.

*සටහන :* ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක්වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා එම ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. ලකුණු ලබා දීමේ ක්‍රමය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර අයදුම්පත්‍ර කැඳවන අවස්ථාවේ දී ප්‍රසිද්ධ කළ යුතු ය.

7.2.4.2.1. **වාචික පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :**

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම මගින් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කිරීම මගින්

7.3 **සීමිත බඳවා ගැනීම :**

7.3.1 **බඳවා ගන්නා ශ්‍රේණිය :**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණිය (සාමාන්‍ය හා විශේෂ සේවක සංඛ්‍යාවට)

7.3.2 **සුදුසුකම් :**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රජයේ පාසල්වල රජයේ අනුමත ආධාර ලබන පාසල්වල හා පිරිවෙන්වල සේවය ස්ථිර කරන ලද ගුරුවරු/ විදුහල්පතිවරු සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

*සටහන :* මෙම අනුග්‍රහය පිරිවෙන්වල සහ ආධාර ලබන පාසල්වල ගුරුවරුන්ට රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබීමට අයිතිවාසිකමක් නොවේ.

7.3.2.1 **අධ්‍යාපන සුදුසුකම් :**

(*අ*) **සාමාන්‍ය සේවක සංඛ්‍යාව:**

**අධ්‍යාපන සුදුසුකම් :**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබා ගත් උපාධිය සහිත ගුරුවරයෙකු වීම ;

හෝ

(ii) ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය ලබා ඇති ගුරුවරයෙකු වීම ; හෝ

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියකු වීම.

(ආ) ***විශේෂ සේවක සංඛ්‍යාව :***

***අධ්‍යාපන සුදුසුකම් :***

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබා ගත් නියමිත විෂයයට අදාළ උපාධිය සහිත ගුරුවරයෙකු වීම ;

හෝ

(ii) නියමිත විෂයය පිළිබඳ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයය පිළිබද ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු වීම ;

හෝ

(iii) තාක්ෂණවේදය විෂයය ධාරාව යටතට ගැනෙන ඉංජිනේරු තාක්ෂණ විෂයය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6) සහිත ගුරුවරයෙකු වීම. (විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ විෂය ක්ෂේත්‍රයන් "ආ" උපලේඛණයේ ඇත.)

7.3.2.2 ***පළපුරුද්ද :***

(අ) **සාමාන්‍ය සේවක සංඛ්‍යාව :**

(i) උපාධි සුදුසුකම් සහිත ගුරුවරයෙකු නම්, අවම වශයෙන් ආසන්නතම වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(ii) ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු නම්, අවම වශයෙන් ආසන්නතම වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(iii) ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරී ගුරුවරයෙකු නම් ආසන්නතම වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පති සේවයට අදාළ තනතුරක ආසන්නතම වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති විදුහල්පති සේවයේ නිලධාරියෙකු වීම.

(ආ) **විශේෂ සේවක සංඛ්‍යාව :**

(i) නියමිත විෂයයට අදාළ උපාධි ගුරුවරයෙකු වශයෙන් වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් ඇති උපාධි සුදුසුකම් සහිත ගුරුවරයෙකු නම්, අවම වශයෙන් ආසන්නතම වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක නියමිත විෂය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(ii) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නියමිත විෂයයට අදාළ උපාධිධාරියෙකු නම්, ආසන්නම වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ; හෝ

(iii) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත ගුරුවරයෙකු නම් අවම වශයෙන් ආසන්නතම වසර හතක (07) ක සක්‍රීය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ;

(iv) කෙසේ වුවද විශේෂ අධ්‍යාපනය / තාක්ෂණය / ශාරීරික අධ්‍යාපනය / බටහිර සංගීතය යන විෂය ක්ෂේත්‍රයන් සඳහා විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශීක්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත වසර හතක (07) කට නොඅඩු සේවයක් ඇති ගුරුවරයෙකු නම් නියමිත විෂයයට / විෂයය ක්ෂේත්‍රයට අදාළ ගුරු පත්වීම් ලබාගැනීමෙන් අනතුරුව අවම වශයෙන් ආසන්නතම වසර පහ (05) තුළ නියමිත විෂයය අඛණ්ඩව ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබීම.

***සටහන*** : මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක දින සිට වසර පහක් (05) යන තුරු ඉංජිනේරු තාක්ෂණ විෂයය ධාරාව යටතේ අයදුම් කිරීම සඳහා ගුරු සේවයේ අදාළ සුදුසුකම් සපුරා ඇති අවම වශයෙන් ආසන්නතම වසර තුනක (03) සක්‍රිය හා සතුටුදායක නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

7.3.2.3 ***වෙනත් :***

(i) සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය ;

(ii) සීමිත තරග විභාගය සඳහා කිසිදු අපේක්ෂකයෙකුට තුන් වතාවකට (03) වඩා පෙනී සිටීමට අවසර නැති අතර විවෘත හා සීමිත යන තරග විභාග දෙකටම එක්ව ගත් විට පස් වතාවකට (05) වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත ;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය ;

(iv) සෑම අපේක්ෂකයෙකුම තමන් අයදුම් කිරීමට සුදුසුකම් ලබන සේවාවේ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතු ය ;

(v) අයදුම් කිරීමට සුදුසුකම් ලබන සේවයේ පත්වීම ස්ථිර කර තිබිය යුතු ය ;

(vi) පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.3.2..4 ***වයස් සීමාව*** : වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතු ය.

7.3.3 ***බඳවා ගැනීමේ ක්‍රමය*** :

7.3.3.1 ***ලිඛිත විභාගය :***

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ.
ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය "2" පරිශිෂ්ඨයේ දැක්වේ.

| ***විෂයයන්*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| (I) සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| (II) තුලනාත්මක අධ්‍යාපනය | 100 | 40% |
| (III) අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණය | 100 | 40% |

7.3.3.1.1 ***පවත්වන බලධරයා*** : විභාග කොමසාරිස් ජනරාල්

7.3.3.2 ***වාචික පරීක්ෂණය*** (ලකුණු 25 යි)

**ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :**

තනතුරට අදාළව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය, තර්කනය හා ගැටළු විසඳීම සහ සන්නිවේදන හැකියාව පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ.

***සටහන :*** ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක්වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා එම ප්‍රමාණයෙන් 50% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. ලකුණු ලබා දීමේ ක්‍රමය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර අයදුම්පත්‍ර කැඳවන අවස්ථාවේදී ප්‍රසිද්ධ කළ යුතු ය.

7.3.3.3 ***වාචික පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා*** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4 **සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම :**

7.4.1 **බඳවා ගන්නා ශ්‍රේණිය:**
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණිය (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට)

7.4.2 **සුදුසුකම්:**

7.4.2.1 **පළපුරුද්ද :**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වැනි ශ්‍රේණියේ අවුරුදු 03 ක අවම සේවා කාලයක් තිබීම.

7.4.2.2 **කායික සුදුසුකම් :**

සැම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.4.2.3 **වෙනත් :**

(i) සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැති අතර, සීමිත සහ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම සඳහා වැනි විභාග දෙකටම පස් වරකට වඩා (05) පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත.

(ii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සැම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

(iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව හෝ ඉන් නිදහස්ව තිබීම.

7.4.2.4 **වයස් සීමාව:**

වයස අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

7.4.3 **බඳවා ගැනීමේ ක්‍රමය :**

7.4.3.1 ලිඛිත විභාගයේ ප්‍රතිඵල හා සේවා පළපුරුද්ද මත බඳවා ගනු ලැබේ.

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02)කින් සමන්විත වේ.
ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය "3" පරිශිෂ්ඨයේ ඇත.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (i) තුලනාත්මක අධ්‍යාපනය | 100 | 40% |
| (ii) අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලනය | 100 | 40% |

***සේවා පළපුරුද්ද:***

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වැනි ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයෙන්, බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලෙස නියම කර ඇති වසර තුන අඩු කල පසු ඊට අතිරේක වශයෙන් I වැනි ශ්‍රේණියේ සේවය කර ඇති සැම සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා උපරිම ලකුණු 60 ක් සේවා පළපුරුද්ද සඳහා ලබා දෙනු ලැබේ. (ලකුණු ලබා දීම සම්පූර්ණ වසරක් සඳහා පමණි) ලකුණු පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වේ.

7.4.3.2 **පවත්වන බලධරයා:** විභාග කොමසාරිස් ජනරාල්

7.4.3.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** ( ලකුණු ලබා දෙනු නොලැබේ )

**ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :–**

බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් හා බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම.

*සටහන.*–ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් ලිඛිත විභාගයෙන් හා සේවා පළපුරුද්ද යන අංශ දෙකෙන්ම ලැබූ මුලු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.4.3.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

*සටහන* : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ දී යම් වර්ෂයකට බඳවා ගත යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

08. **කාර්යක්ෂමතා කඩඉම** :

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| I වැනි කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත විභාගය (4 වැනි පරිශිෂ්ඨය) |
| II වැනි කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වැනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත විභාගය (4 වැනි පරිශිෂ්ඨය) |
| III වැනි කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වැනි ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත විභාගය (4 වැනි පරිශිෂ්ඨය) |

8.2 **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද** : වර්ෂයකට දෙවරක්

8.3 **පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා** :විභාග කොමසාරිස් ජනරාල්

09. **භාෂා ප්‍රවීණතාව** :

9.1

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුනක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතු ය. සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳ විස්තර 7 පරිශිෂ්ඨයේ දැක්වේ. **සටහන** : නිලධාරියෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ඇතිනම් සන්ධාන භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවාගත් නිලධාරියෙකු ද මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. |

10. **ශ්‍රේණි උසස් කිරීම :**

10.1 III **වැනි ශ්‍රේණියේ සිට** II **වැනි ශ්‍රේණියට උසස් කිරීම:**

විශේෂ සේවක සංඛ්‍යාව යටතේ පත්වීම් ලද නිලධාරීන් II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ දී විශේෂ සේවක සංඛ්‍යාව යටතේම උසස්වීම් සිදු කෙරේ.

10.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) සේවයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.

(ii) I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(iii) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

(iv) සන්ධාන භාෂාව සමත් වී හෝ ඉන් නිදහස් කරනු ලැබ තිබීම.

(v) අධ්‍යාපන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

(vi) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්ව තිබීම.

(vii) III වැනි ශ්‍රේණියේ පත්වීම ස්ථිර කර තිබීම.

(viii) උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වූ වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ix) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර දහය (10) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.1.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියමිත ආකෘතියෙන් ඉල්ලීමක් කරනු ලැබූවිට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වැනි ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. ඉල්ලුම් කළයුතු ආකෘති පත්‍රය "8" පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

10.2 II **වැනි ශ්‍රේණියේ සිට** I **වැනි ශ්‍රේණියට උසස් කිරීම:**

10.2.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) සේවයේ II වැනි ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක් සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(ii) II වැනි කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත්ව තිබීම.

(iiii) නියමිත දිනට ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

(iv) උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(vi) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පහත සටහනේ සඳහන් අධ්‍යාපන ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ බඳවාගත් විෂයය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

***සටහන*** : සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ සේවයට ඇතුළත්වූ නිලධාරීන් සඳහා විශේෂ අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන ප්‍රතිපත්ති, තෘතියික අධ්‍යාපන කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇගයීම් හා පරීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන් අදාළ විෂය ක්ෂේත්‍රයන් වේ.

10.2.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍ර මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට,පත්කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ I වැනි ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය ''09'' පරිශිෂ්ඨයේ දැක්වේ.)

10.3. **I වැනි ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට පත් කිරීම :**

10.3.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

(ii) III වැනි කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත්ව තිබීම.

(iii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පහත සටහනේ සඳහන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් කවර විෂයයකට හෝ අයත් විෂයය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ බඳවාගත් විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(v) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ විධායක සේවා ගණයේ වසර දහඅටකට (18) නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(vi) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව නියමිත කාලය තුළ සාර්ථකව හදාරා තිබීම.

(vii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

*සටහන.–* සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ සේවයට ඇතුළත් වූ නිලධාරීන් සඳහා විශේෂ අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන ප්‍රතිපත්ති, තෘතියික අධ්‍යාපන කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇගයීම් හා පරීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන් අදාළ විෂය ක්ෂේත්‍රයන් වේ.

10.3.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සපුරාලන නිලධරයන්ගේ සේවයේ 1 ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. **තනතුරුවලට පත් කිරීම :**

11.1 **සුදුසුකම් :**

| *අංකය* | *තනතුර* | *සුදුසුකම්* |
|---|---|---|
| 1 | අධ්‍යාපන අමාත්‍යාංශ අතිරේක ලේකම් | ශ්‍රී.ලං.අ.ප.සේ.. විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 2 | විභාග කොමසාරිස් ජනරාල් | ශ්‍රී.ලං.අ.ප.සේ.. විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 3 | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් | ශ්‍රී.ලං.අ.ප.සේ.. විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 4 | ප්‍රධාන කොමසාරිස් ගුරු අධ්‍යාපන | ශ්‍රී.ලං.අ.ප.සේ.. I ශ්‍රේණියේ වසර 05 ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම |
| 5 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ.. I ශ්‍රේණියේ වසර 05 ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම |

| අංකය | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| 6 | අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන අමාත්‍යාංශය | ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 7 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. Iශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 8 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 9 | විභාග කොමසාරිස් | ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 10 | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් | ශ්‍රී.ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 11 | විදුහල්පති | ශ්‍රී.ලං.අ.ප.සේ. I/II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 12 | නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන අමාත්‍යාංශය) | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 13 | නියෝජ්‍ය විභාග කොමසාරිස්/ සහකාර විභාග කොමසාරිස් | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III සාමාන්‍ය සේවකසංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 14 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ නිලධාරියෙකු වීම |
| 15 | කලාප නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 16 | නියෝජ්‍ය විදුහල්පති | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 17 | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 18 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ විශේෂ සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 19 | කලාප සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ විශේෂ සේවක සංඛ්‍යාවේනිලධාරියෙකු වීම |
| 20 | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 21 | නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පළාත් අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය) (උතුරු මැද, සබරගමුව) | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 22 | නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය) (බස්නාහිර) | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |
| 23 | පළාත් පාසල් විදුහල්පති (දකුණ, බස්නාහිර) | ශ්‍රී.ලං.අ.ප.සේ. II/III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ නිලධාරියෙකු වීම |

සටහන : ඉහත තනතුරුවලට තෝරා ගනු ලබන ක්‍රමය ''05''පරිශිෂ්ඨයෙහි ඇත.

12. සේවයට අදාළ කොන්දේසිඃ

12.1 ***ස්ථිර කිරීමේ කොන්දේසි :***

12.1.1 විවෘත බඳවා ගැනීම අනුව සේවයේ III වැනි ශ්‍රේණියට බඳවාගනු ලැබූ නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

(i) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත් වීම,
(ii) මෙම ව්‍යවස්ථාවෙහි 9.1 හි නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීම හා සන්ධාන භාෂා ප්‍රවීණතාව ලබා තිබීම,
(iii) පරිවාස කාලය තුළ තම රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් ඇති නිලධාරීන් පරිවාස කාලය අවසානයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.1.2 සීමිත බඳවා ගැනීම හෝ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම අනුව සේවයේ III වැනි ශ්‍රේණියට බඳවාගනු ලැබූ නිලධාරියෙකු වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත. (වැඩ බැලීමේ කාලය තුළ රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන තිබේ නම් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර කරනු ලැබේ.)

12.2 **පුහුණුව හා සංවර්ධනය :**

*සේවාරම්භක පුහුණුවඃ*

සේවයට බඳවා ගනු ලබන සෑම නිලධාරියෙකුම අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලබන ආයතනයක් මගින් සේවාරම්භක පුහුණුවක් සම්පූර්ණ කළ යුතු ය. පුහුණුව අවසානයේ පවත්වන පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වන නිලධාරීන් ඔවුන් විසින් රාජ්‍ය සේවයේ කලින් දැරූ තනතුරුවලට ආපසු යැවීම හෝ සේවය අවසන් කිරීම සිදු කරනු ඇත.

සේවාරම්භක පුහුණුවේ කාලය පහත සඳහන් පරිදි වේ :–

| | | | |
|---|---|---|---|
| (i) | විවෘත තරග විභාගයකින් බඳවාගනු ලබන නිලධාරීන්ට | - | මාස 12 |
| (ii) | සීමිත තරග විභාගයකින් බඳවාගනු ලබන නිලධාරීන්ට | - | මාස 03 |
| (iii) | සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවාගනු ලබන නිලධාරීන්ට | - | මාස 02 |

*සටහනඃ* ප්‍රායෝගික පුහුණුවක් සහිත වූ මෙම වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් හා හා අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන මගින් ලබාදෙනු ඇත.

12.3 **මුදා හැරීමේ කොන්දේසි :**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් මෙම සේවය සඳහා පළාත් රාජ්‍ය සේවයේ අනුමත තනතුරුවල සේවය කිරීමට බැඳී සිටින්නේය. මේ සඳහා පළාත් රාජ්‍ය සේවය සඳහා තාවකාලික මුදාහරිනු ඇත. එසේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාව මත කාර්ය මණ්ඩල යෙදවීමේ බලධරයා අතර ඇති කරගනු ලබන එකඟතාවය මතය :–

(i) අදාල පළාත් බලධාරීන් විසින් පළාත තුල ස්ථානගත කිරීම හා ස්ථාන මාරු කිරීම් කරනු ඇත,
(ii) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරිනු ලැබුව ද, එම කාලය තුළදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත්වනු ඇත,
(iii) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරින ලද කාලය අවසානයේ දී නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතු ය.

12.4 **සේවයට බඳවා ගැනීම සහ ශ්‍රේණිගත උසස්වීම් සිදු කිරීම**

සේවයට බඳවා ගැනීම සහ ශ්‍රේණිගත උසස් කිරීම් මෙම ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු ය.

12.5 සේවයේ නිලධාරීන්ට මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ "අ" උපලේඛනයේ දක්වා ඇති බඳවා ගනු ලබන තනතුරු දැරිය හැකි අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටී.

12.6 මෙම ව්‍යවස්ථාවේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වැනි ප්‍රවීණතා හා නිපුණතාවයන් ද සියළු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතු ය.

**13. අර්ථ නිරූපනය හා නිර්වචන**

(I) *"සේවය"* යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයයි.

(II) *"සේවා ව්‍යවස්ථාව"* යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථාවයි.

(III) *"ගැසට් පත්‍රය"* යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

(IV) *"නියමිත විෂයය"* යනු විශේෂ සේවක සංඛ්‍යාව යටතේ උපලේඛන ''ආ''යටතේ ඉල්ලුම් කරනු ලබන විෂයයන්, උපාධි පාඨමාලාවේ ප්‍රධාන විෂයයන් ලෙස හදාරා තිබීම හෝ මුළු විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක් වත් අයඳුම්කරන විෂයට අදාලව හදාරා තිබීම.

(V) *"අදාල ක්ෂේත්‍රය "* යනුවෙන් අදහස් කරනුයේ අධ්‍යාපන ලේකම් විසින් අනුමත කරන ක්ෂේත්‍රයක් වේ.

(VI) *"ලේකම්"* යනුවෙන් අදහස් කරනුයේ අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වේ.

(VII) *"සක්‍රීය සේවා කාලය"* යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් සේ සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයක් හැර අනිකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

(VIII) *"අමාත්‍යාංශය"* යනුවෙන් අදහස් කරනුයේ අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශ වේ.

(IX) *"ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව"* යනු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යා පීඨයකින් ලබා ගන්නා ලද ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වේ.

(X) *"ගුරු පුහුණු සහතිකය"* යනු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නොඅඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දුරස්ථ ක්‍රමය මගින් හදාරන ලද තෙවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් වේ.

(XI) *"ශ්‍රී.ලං.අ.ප.සේ."* යනු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයයි.

**14. සේවයේ සිටින්නන් අන්තර්ග්‍රහනය කිරීම**

මෙම පරිපාටිය ක්‍රියාත්මක වැනි දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL-01- 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතු ය.

(අ) ක්‍රියාත්මක දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 වැනි පන්තියේ සේවය කරන නිලධාරින්, මෙම සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 වැනි ශ්‍රේණියටද,

(ආ) ක්‍රියාත්මක දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 11 වැනි පන්තියේ සේවය කරන නිලධාරින්, මෙම සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 11 වැනි ශ්‍රේණියටද,

(ඇ) ක්‍රියාත්මක දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ සේවය කරන නිලධාරින්, මෙම සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වැනි ශ්‍රේණියටද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

***සටහන* : *මෙම ව්‍යවස්ථාවට අනුකූලව මිස වෙනත් කිසිම හේතුවක් මත මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම කරනු නොලැබේ.***

15. **අන්තර්කාලීන විධිවිධාන :**

අන්තර්කාලය 2017 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වේ.

15.1 *විශේෂ ශ්‍රේණියට උසස් කිරීම*

අන්තර්කාලය තුළදී විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේදී III වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම අනිවාර්යය නොවේ.

15.2 *I වැනි ශ්‍රේණියට උසස් කිරීම*

අන්තර් කාලය බල පැවැත්වෙන කාලය තුළදී I වැනි ශ්‍රේණියට උසස් කිරීම අංක 1490/21 හා 2007 මාර්තු මස 30 වැනි දිනැති විශේෂ ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට කරන ලද සංශෝධනය අනුව සිදු කෙරේ.

15.3 *II වැනි ශ්‍රේණියට උසස් කිරීම*

අන්තර් කාලය තුළදී II වැනි ශ්‍රේණියට උසස් කිරීම අංක 1225/32 හා 2002 මාර්තු මස 01 වැනි දිනැති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සිදු කෙරේ.

15.4 අන්තර්කාලය තුළ සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම් සඳහා අවුරුදු 58 දක්වා අයදුම් කළ හැක.

15.5 අන්තර් කාලය තුළදී උසස් කිරීම සඳහා ධාරිතා සංවර්ධන පාඨමාලා සම්පූර්ණ කර තිබීම අනිවාර්යය නොවේ.

16. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/ 30 හා 2009.02.20 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

17. මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

"අ" උපලේඛනය

*සේවයට අයත් තනතුරු*

| අංකය | තනතුරු නාමය | විශේෂ ශ්‍රේණිය | I වැනි ශ්‍රේණිය | II වැනි ශ්‍රේණිය | II/III වැනි ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) | 01 | | | |
| 2. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ( ප්‍රතිපත්ති සැලසුම් හා ප්‍රගති සමාලෝචන) | 01 | | | |
| 3. | විභාග කොමසාරිස් ජනරාල් | 01 | | | |
| 4. | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් | 01 | | | |
| 5. | ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) | | 01 | | |
| 6. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | | 09 | | |
| 7. | විදුහල්පති | | 64 | | 84 (සාමාන්‍ය) |
| 8. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ | | 35 | | |
| 9. | අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ | | 03 | | |
| 10. | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | | 19 | | |
| 11. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | | 97 | | |
| 12. | විභාග කොමසාරිස් | | 08 | | |
| 13. | ප්‍රකාශන කොමසාරිස් | | 02 | | |
| 14. | පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | | | 40 | |
| 15. | කලාප නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | | | 388 | |
| 16. | අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | | | | 92 (සාමාන්‍ය 49) (විශේෂ 43) |
| 17. | අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | | | | 07 (විශේෂ) |
| 18. | නියෝජ්‍ය විභාග කොමසාරිස් / සහකාර විභාග කොමසාරිස් | | | | 64 (සාමාන්‍ය) |
| 19. | නියෝජ්‍ය අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් / සහකාර අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් | | | | 38 (සාමාන්‍ය 08) (විශේෂ 30) |
| 20. | විදුහල්පති /නියෝජ්‍ය විදුහල්පති | | | | 148 (සාමාන්‍ය) |
| 21. | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | | | 01 | 08 (සාමාන්‍ය) |
| 22. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | | | | 130 (විශේෂ) |
| 23. | කලාප නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | | | | 1057 (විශේෂ) |
| 24. | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ | | | | 329 (සාමාන්‍ය) |
| 25. | නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන (උතුරු මැද - 01/ සබරගමුව - 02) | | | | 03 (සාමාන්‍ය) |
| 26. | නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (බස්නාහිර) | | | | 04 (සාමාන්‍ය) |
| 27. | පළාත් පාසල්වල විදුහල්පති (දකුණ - 12 හා බස්නාහිර - 44) | | | | 56 (සාමාන්‍ය) |
| | එකතුව | 04 | 238 | 429 | 2020 |
| | **මුළු එකතුව** | **2691** | | | |

''ආ'' උපලේඛනය

**විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ විෂය ක්ෂේත්‍රයන්**

| විෂය ක්ෂේත්‍රය | බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් |
|---|---|
| 1. සිංහල<br>2. දෙමළ<br>3. ඉංග්‍රීසි හා වෙනත් භාෂා<br>4. ගණිතය<br>5. විද්‍යාව<br>6. වාණිජ විද්‍යාව<br>7. තොරතුරු තාක්ෂණය<br>8. ශාරීරික අධ්‍යාපන<br>9. බුද්ධාගම<br>10. ක්‍රිස්තියානි<br>11. හින්දු<br>12. ඉස්ලාම්<br>13. ශිෂ්‍ය උපදේශනය හා මර්ගෝපදේශනය | (I) නියමිත විෂයයට අදාළ උපාධිය හෝ උපාධියේ කොටසක් ලෙස නියමිත විෂය ප්‍රධාන විෂයයන් ලෙස හදාරා තිබීම, මුළු විෂයය ඒකක සංඛ්‍යාවෙන් 1/3 ක්වත් අයදුම් කරන විෂයයට අදාළව හදාරා තිබීම.<br>(II) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයයට අදාළව ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබා තිබීම<br>.(සම්මුඛ පරීක්ෂණයේදී සහතික මගින් සනාථ කළ යුතු ය ) |
| 14. සෞන්දර්ය | නියමිත විෂයයට අදාළව උපාධි වනුයේ චිත්‍ර, නැටුම්, පෙරදිග, සංගීතය, බටහිර සංගීතය, නාට්‍ය හා රංග කලාව විෂය ක්ෂේත්‍රයේ උපාධි වේ. |
| 15. තාක්ෂණය(ජෛව පද්ධති තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදයද ඇතුළත්ව) | (I) කෘෂි විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ගෘහ විද්‍යාව, කෘෂි විද්‍යාව, හස්ත කර්මාන්තය, ජීවන නිපුණතා සඳහා වන ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබා තිබීම.<br>(II) තාක්ෂණවේදය යටතේ ඉංජිනේරු තාක්ෂණ විෂයය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තාක්ෂණවේදී උපාධිය හෝ යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES)හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාව (NVQ Level 6) ලබා තිබීම. |
| 16. විශේෂ අධ්‍යාපනය | (I) විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගෙන තිබීම.<br>(II) විශේෂ අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරු විද්‍යාලකින් ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.<br>(III) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් විශේෂ අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |

| විෂය ක්ෂේත්‍රය | බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් |
|---|---|
| 17. සැලසුම් | පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රවලින් අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් වත් ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඉන් සමත්ව, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා ගෙන තිබීම.<br><br>විෂය ක්ෂේත්‍රයන්<br>* සංඛ්‍යාන විද්‍යාව<br>* ගණිතය විෂය<br>* කළමනාකරණය<br>* අධ්‍යාපන විද්‍යාව; මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය<br>* සමාජ විද්‍යාව<br>* ජෛව විද්‍යාව<br>* භෞතික විද්‍යාව<br>* ආර්ථික විද්‍යාව |
| 18. ප්‍රාථමික අධ්‍යාපනය | (I) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන තිබීම.<br><br>(II) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරුවිද්‍යාලකින් ගුරු පුහුණු සහතිකයක් ලබා තිබීම.<br><br>(III) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| 19. ඉතිහාසය | ඉතිහාසය විෂයය සහිත උපාධියක් ලබා ගෙන තිබීම. |

**'1' පරිශිෂ්ඨය**

01. **විභාගයේ නම** : **ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වන විවෘත තරග විභාගය**

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අවබෝධය | කාලය පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | කාලය පැය 01 | 100 | 40 |
| රචනය හා සාරාංශය | කාලය පැය 01. වි.30 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය ඃ

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| අවබෝධය | අපේක්ෂකයාට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර, ඉන් එකක් එම පාඨයේ ඇති කරුණු වලට ඉතා හොඳින් ගැළපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. දෙන ලද සියළු පාඨවල අර්ථය විභාග අපේක්ෂකයා විසින් වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. |
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම පිණිස සකසන ලද ප්‍රශ්න පත්‍රයකි. |
| සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජයීය සංස්කෘතික හා ආර්ථික පරිසරය සහ අධ්‍යාපන ක්‍රමය ඇතුළුව අපේක්ෂකයා ජීවත්වන සහ වැඩකරන පරිසරය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
